කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

**නාට්‍ය හා රංගකලාව** (නව/පැරණි නිර්දේශය)

**නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව DMAT – E 3015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දහනවය සහ විසිවන සියවස්වල යුරෝපීය සමාජයේ ඇති වූ විපර්යාසයන් නූතන නාට්‍ය කලාව කෙරෙහි ඇතිකළ බලපෑම නිදර්ශන සහිතව දක්වන්න.

02. ඇමරිකානු ජන සමාජයට නූතන විදග්ධ නාට්‍ය කලාව ආරෝපණය වූයේ කෙසේදැයි විමසන්න.

03. පළමු හා දෙවන ලෝක යුද්ධයන්ගෙන් පසු යුරෝපීය සමාජයේ ඇති වූ වෙනස්කම් 'සම්මත' නාට්‍ය කලාවේ වෙනස්වීම් කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් සහිතව විමසන්න.

04. "සම්මතය පැන නැගෙනුයේ අප එකිනෙකා අතර නොව අප ගතකරන අර්ථ විරහිත ජීවිතය සමඟ ය." චෙරිවත්ත **(The Cherry Orchard)** නාට්‍යයේ කථාවින්‍යාසය හා චරිත ඇසුරින් විග්‍රහ කරන්න.

05. "යථාර්ථවාදී පිවිසුමත් සංකේතවාදී නැඹුරුවත් හෙන්රික් ඉබ්සන්ගේ නාට්‍ය නිර්මාණයන් හි දැකිය හැකි ලක්ෂණයකි." සෙල්ලම් ගෙය **(A Doll's House)** නාට්‍යය ඇසුරින් පහදන්න.

06. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ එපික් රංග රීතියෙහි විශේෂණ, අරමුණු හා රංග ප්‍රයෝග හුණුවටයේ කථාව **(The Caucasian Chalk Circle)** නාට්‍යය ඇසුරින් විග්‍රහ කරන්න.

07. අසම්මත **(Absurd)** හෙවත් න්‍යාය විරෝධී නාට්‍ය සම්ප්‍රදායේ කථාවින්‍යාසයේ හා චරිතවල විශේෂ ලක්ෂණ සැමුවෙල් බෙකට් ගේ ගොඩෝ උන්නැහේ එනකං **(Waiting for Godot)** ඇසුරින් විග්‍රහ කරන්න.

08. "අපේ ලෝකය එළිය වෙන්නේ ඉටිපන්දම් එළියෙන් නෙවෙයි ලෝරා අපට හෙණ පුපුරණ කොට විහිදෙන ආලෝකයෙන්." ඇමරිකානු සිහිනයේ ඛේදාන්තය කාව්‍යමය භාෂාවකින් හා ගැඹුරු චරිත නිරූපණයකින් යුතුව නිරූපණය කරන ආකාරය පුංචි පළිඟු රැන **(The Glass Menagerie)** නාට්‍යය ඇසුරෙන් විමසන්න.

09. ඇමරිකානු නාට්‍ය රචකයන්ට බලපෑ යුරෝපීය නාට්‍ය රචකයන් පිළිබඳ සංසන්දනාත්මක විවරණයක් කරන්න.

10. පහත මාතෘකා අතරින් දෙකක් පිළිබඳ විවරණයක් කරන්න.

    1. එපික් රංග රීතිය
    2. දිළිඳු රංගය
    3. ප්‍රකාශනවාදය
    4. කුරිරු රංගය

***************************